**ශීර්ෂය 159 - සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය**

---

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය නොකළ මතය**

සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතුඅමාත්‍යාංශයේ 2018දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබදව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය නොකළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

--------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයවිසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරීසහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.5 **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

**--------------------------------------------**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතුඅමාත්‍යාංශය විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ අනුරූපීවන බව ප්‍රකාශ කළ නොහැක.

(ආ) අමාත්‍යාංශය විසින්ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත්කර නොතිබුණි.

2. **මූල්‍ය සමාලෝචනය**

**--------------------**

2.1 **වියදම් කළමනාකරණය**

**------------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| ැය විෂයයන් 03 ක් සඳහා සලසා තිබූ රු.350,300,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. | නියෝජ්‍ය අමාත්‍යවරයකු පත් නොවූ හෙයින් ගෙවල් කුලී ගෙවීමට සිදු නොවීම සහඅයවැය යෝජනා මඟින් ඉදිරිපත් කර තිබූ රු.මිලියන 300 ක ව්‍යාපෘතිය මුදල් අමාත්‍යාංශය මඟින් පවරාගෙන තිබීම හා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය මඟින් ක්‍රියාත්මක කරනු ලැබූ ව්‍යාපෘතිවල බිල්පත් පියවීමට අක්මුදල් නොලැබීම. |

### 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුදල් රෙගුලාසි 94 ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තුවල මුදල් ප්‍රතිපාදන ඇත්නම් පමණක් බැඳීම්වලට එළඹිය යුතු වුවත්, මෙහෙයුම් වැඩසටහන් 03 ක ඉතිරියඉක්මවා රු.1,887,833 ක බැඳීම්වලට එළඹ තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | අදාල වර්ෂයේ දෙසැම්බර් මාසයට අදාල බිල්පත ඊළඟ වර්ෂයේදී පියවිය යුතු වගකීමක් වේ. |

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ)2016 වර්ෂයේදී මඩකළපුව කල්ලඩි වෙරළ තීරයෙහි කරන ලද සංවර්ධන කටයුතුසම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| **(i)** ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන ඇස්තමේන්තු වටිනාකම රු.මිලියන 39.188 ක් වන බැවින් ප්‍රසම්පාදන සඳහා ජාතික තරඟකාරී ලංසු කැඳවීමක් කළ යුතු වුවත් සීමිත වෙළඳපල මිල සැඳහුම් ක්‍රමය අනුගමනය කර තිබුණි. | 2016 සැප්තැම්බර් 30 දිනැති අංක 04/2016 **(i)** දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළයුතුවීම. | 2016/2017 වර්ෂයට අදාළ කොන්ත්‍රාත්කරුවන්ගේ ලියාපදිංචියට විවෘත තරඟකාරීත්වයෙන් පුවත්පත් වල පළකර ලබාගත් ඉල්ලුම්පත් වලට අනුව සිදු කරන ලදී. එම ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ගෙන් මිල ගණන් කැඳවන ලදී. |

| | | |
|---|---|---|
| **(ii)** වර්ග අඩි 120 ක් බැගින් වූ තාවකාලික කඩ 10 ක් ඉදිකිරීම හා වර්ග අඩි 1346.8 ක ප්‍රමාණයේ දෙමහල් තාවකාලික අවන්හල් 2 ක් ඉදිකිරීමට ලබා දී තිබූ බලපත්‍රය අනුව වෙරලේ සිට (Permanent Vegetation Line) මීටර් 45 ක දුර සීමාව තුල ඉදිකිරීම් කිසිවක් නොකළ යුතුවුවද ඉන් අවන්හලක් සහ කඩකාමර 05 ක් අනවසර සීමාව ඇතුළත ඉදිකර තිබුණි.තවදඉදිකර තිබූ සියළුම ඉදිකිරීම් ස්ථිර ගොඩනැගිලි විය. | ඉදිරිකිරීම් සඳහා නිකුත් කළ අවසර පත්‍රයේ රෙගුලාසිවලට අනුකූලව ඉදි කිරීම් කළ යුතු වීම. | ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව එක් වඅධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කර තිබුණි. මෙම ඉදිකිරීම්වල ස්ථිර ව්‍යුහය ස්ථාපිත කිරීම සම්බන්ධ පිළිගෙන වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවට වාර්තා කර ඇත. |
| **(iii)** සූර්ය විදුලි පහන් කණු සවි කිරීමට වැඩ විෂයක් යටතේ එකක් රු. 30,000 කට සිදුකර තිබුණි. එම විදුලි පහන්මඅමතර වැඩ විෂයක්යටතේ රු. 151,200 කට එකඟ වීම හේතුවෙන් රු. 6,423,600 ක් වැඩිපුර ගෙවීම් කර තිබුණි. | අනාවරනය කරගත හැකි අලාභය අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | මෙවැනි සංචාරක මධ්‍යස්ථාන ඉදිකිරීම සම්බන්ධ ව්‍යාපෘතිවල ක්‍රියාත්මක කිරීම පළමු වතාවට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් සිදුකර තිබීමත් ක්‍රියාත්මක කිරීමේදී ඇතිවිය හැකි අත්හැරීම් හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේදී ආරම්භයේ අවධානයට ගෙන නැතිවීම පිළිගත හැකි කාරණයකි. ඉදිරි කාලයේ මෙම කාරණාවලට අවධානය යොමු කරනු ලැබේ. |
| (ආ)මඩකළපුව සල්ලතිව් දූපතේ සංවර්ධන කටයුතු වෙනුවෙන් රු. 9,992,200 ක් වැයකර ඉදි කරන ලද දෙමුහුන් නිවාස දෙක කෝරලේ පත්තු ප්‍රාදේශීය සභාවට බාර දී වසර 2 ½ ක් ගතවී තිබුණද විදුලිය හා ජලය නොමැතිවීම හේතුවෙන් සංචාරකයින් සඳහා විවෘත කර නොතිබුණි. | ජල හා සනීපාරක්ෂක පහසුකම් සපයා සංචාරකයන්ට ප්‍රයෝජනයට ගත හැකි ආකාරයට සකස් කළ යුතු වීම. | කෝරලේ පත්තු උතුර ප්‍රාදේශීය සභාව බවුසර් මඟින් ජල පහසුකම් ලබා දීමට එකඟ වී ඇති අතර විදුලි ජනක යන්ත්‍රය ප්‍රතිසංස්කරණය කර ඇති අතර විදුලිය ලබා දීමට කටයුතු කරමින් පවතී. |

| | | |
|---|---|---|
| (ඇ)එරාවූර් සවුක්කඩි වෙරළ තීරයේ,වෙරළ උද්‍යානයක් නිර්මාණය කිරීමේ කොන්ත්‍රාත් ගිවිසුම අනුව 2017 දෙසැම්බර් මස 30 දින වැඩ අවසන් කළ යුතුව තිබුණි.එසේ වුවද මාස 04ක් ප්‍රමාදව වැඩ අවසන් කර තිබීම හේතුවෙන් ප්‍රමාද කාලයට අයවිය යුතුරු.347,714 ක් අය කර ගෙන නොතිබුණි.තවද ඉදි කර තිබූ කඩකාමර වෙළඳාම් කටයුතු සඳහා යොදවා නොතිබීම හා සනීපාරක්ෂක ස්ථාන මහජනතාව සඳහා විවෘත නොකර තිබීම හේතුවෙන් ඒවා නිෂ්ක්‍රීයව පැවතුණි. | කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව කටයුතු කළ යුතු අතර මහජනතාවට ප්‍රතිලාභ ලබා දීමට කටයුතු කළ යුතු වීම. | ප්‍රධාන ලේකම් නැගෙනහිර පළාත වෙතින් පැහැදිලි කිරීමක් ගෙන්වා ගැනීමට කටයුතු කරන බව. |

**3.2 රජයේ නිලධාරීන් ඇප තැබීම**
**------------------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය**<br>**--------------------** | **නිර්දේශය**<br>**-------------** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**<br>**---------------------------------** |
|---|---|---|
| මුදල් රෙගුලාසි 880 සඳහන් විධිවිධාන ප්‍රකාරව අමාත්‍යාංශයේ ඇප තැබිය යුතු නිලධාරීන්ගෙන් ඇප ලබාගෙන නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතු වීම. | මීට අදාල කටයුතු භාණ්ඩාගාර උපදෙස් ද සහිතව ඉටු කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලදී. |